122768
I
06/10

250/

# ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය

1963 සාමාන්‍ය උපාධි පරීක්ෂණය

## අධුනා යුගයේ මෙලදිව අධ්‍යාපනය

බෙල්ලන ඊදාරුවාවම ලතාහාමි

පරීක්ෂණ අංකය: S.H.A. 4

පරීක්ෂක පුස්තකය

122768

## පටුන


සංක්ෂේප විකාශනය 1 — iV - V

පෙරවදන — Vi - X

1 වන පරිච්ඡේදය

- අ. අටුවා යුගය — 1 - 7
- ආ. අධ්‍යාපනය — 7 - 9

2 වන පරිච්ඡේදය

- ඉගෙනීමේ වයස — 10 - 14

3 වන පරිච්ඡේදය

භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපන විෂය

- අ. බුද්ධ ධර්මය — 15 - 16
- ආ. විවිධ භාෂා — 16 - 19
- ඉ. කියුම් කලාව — 19 - 20
- ඊ. නවකර්ම — 21 - 22
- උ. විවිධ ශාස්ත්‍ර — 22 - 28

4 වන පරිච්ඡේදය

ගිහි සමාජයේ අධ්‍යාපන විෂය

- අ. ලිවීම හා කියවීම — 29 - 32
- ආ. වෘත්තීය අධ්‍යාපනය — 32 - 38
- ඉ. වෛද්‍යශාස්ත්‍ර — 38 - 44
- ඊ. කෘෂිකර්මය — 45 - 48
- උ. ගණිත — 49 - 51
- ඌ. මුද්‍රණික — 51 - 52
- එ. යුද්ධ කටයුතු — 52 - 54
- ඒ. මසුන් ඇල්ලීම හා දඩයම — 55- 57

ඔ. ලෝහ 1 57 - 59

ඕ. ස්තූප නිර්මාණය 59 - 60

ක. වෙළඳාම 61 - 62

ඛ. සියුම් කලා 62 - 63

ග. ලලිත කලා 64 - 67

ඝ. වඪකී කම්ම 67 - 75

ඞ. යාන වාහන 76 - 77

ච. කුම්භකාර 77 - 79

ඡ. කම්මාර 79 - 80

ජ. පේසකාර 80 - 81

ඣ. රජක 82

ඤ. වෙනත් ශිල්ප 82 - 83

5 වන පරිච්ඡේදය

කාන්තාවන්ගේ අධ්‍යාපනය 84 - 88

6 වන පරිච්ඡේදය

රජ කුමරුවන්ගේ අධ්‍යාපනය 89 - 92

7 වන පරිච්ඡේදය

අධ්‍යාපනායතන හා ඉගෙනීමේ ක්‍රම 93-107

8 වන පරිච්ඡේදය

ගුරුවරයා හා ශිෂ්‍යයා 108 - 110

9 වන පරිච්ඡේදය

පොත් පත් 111 - 113

10 වන පරිච්ඡේදය

සාමාන්‍ය බුද්ධ වර්ධනය 114 - 115

අටුවා යුගයෙන් පසු .... 116

නිගමනය 117

ග්‍රන්ථ විවෘති 118 - 120

## සංක්ෂෙප විකාශය

| | |
|---|---|
| අකෝ | අභිධර්ම කෝෂ |
| අකෝටී | අභිධර්ම කෝෂ ටීකා |
| කප | කථාවත්ථුප්‍රකරණ |
| කවි | කංඛා විතරණී |
| ගා | ගාථාව |
| චතුඅ | චතුභාණවාරට්ඨකථා |
| ජාඅ | ජාතකට්ඨකථා |
| ජාගැ | ජාතක අටුවා ගැටපදය |
| දීනි | දීඝ නිකාය |
| දීවං | දීප වංශ |
| ධඅ | ධම්මපදට්ඨකථා |
| ධපා | ධම්මපද පාලි |
| පදී | පරමත්ථ දීපනී |
| පසූ | පපඤ්චසූදනී |
| පාසාඉ | පාලි සාහිත්‍යය ඉතිහාසය |
| පාදේවා | පාහියංගේ දේශාටන වාර්තාව |
| මනි | මජ්ඣිම නිකාය |
| මනු | මනුස්මෘතිය |
| මපා | මහාවග්ග පාලි |
| මපු (ධසං) | මනෝරථ පූරණී (ධර්මාරාම නාහිමි සංස්කරණය) |
| මපු (හේමු) | මනෝරථ පූරණී (සයිමන් හේවාවිතාරණ මුද්‍රණය) |
| මසික | මධ්‍යකාලීන සිංහල කලා |
| මවං | මහාවංශ |
| රවා | රසවාහිනී |
| ලස් | ලංකාවේ ස්තූප |

| | |
|---|---|
| විඉස | විදේශීය ඉතිහාස සාරාව |
| විම | විසුද්ධි මග්ග |
| විත්‍රිමු | විද්‍යාලංකාර ත්‍රිපිටක මුද්‍රණය |
| ශ්‍රී | ශ්‍රීපාද ග්‍රන්ථමාලා |
| සපා | සමන්තපාසාදිකා |
| සවි | සම්මෝහ විනෝදනී |
| සාප | සාරත්ථපකාසිනී |
| සිවිකෝ | සිංහල විශ්ව කෝෂය |
| සීව | සීහල වත්ථුප්පකරණය |
| සුවි | සුමංගල විලාසිනී |
| සුඅ | සුත්තනිපාතට්ඨකථා |
| සුනි | සුත්ත නිපාත |
| හිවි | හින්දි අක්ෂරයෙන් මුද්‍රිත විසුද්ධිමග්ග |
| හේමු | සයිමන් හේවාවිතාරණ මුද්‍රණය |
| A.I.C | Ancient Inscriptions in Ceylon |
| Ehbc | Early History of Buddhism in Ceylon |
| E.Z | Epigraphia Zeylanica |
| H.C | History of Ceylon |
| Hbc | History of Buddhism in Ceylon |
| H.I.L | A History of Indian Literature. Vol.2 |
| M.V. | Mahavansa (English Translation) |
| Pbi. | Pre-Buddhist India |
| Sg. | Sigiri Graffiti |

## පෙරවදන

දැනුම වඩා ගැනීමේ මාර්ගය අධ්‍යාපනයයි. ඉන් ලබාගන්නා දැනුම අධ්‍යාපනයේ ප්‍රතිඵලය වේ. අප ලබා ඇති දැනුමේ කොටසක් නෛසර්ගිකය. කොටසක් යත්නසිද්ධය. ගසක මුලක් පොහොර ඇති තැන සොයා ගොස් ගස පෝෂණය කිරීමට දනී. ගසක කොළයක් වාතයේ ඇති අංගාර කොටස් උරාගෙණ එයින් ද්‍රව්‍යයක් නිපදවීමට දනී. වසුපැටවෙක් මවගේ තන පුඩු සොයාගෙණ කිරි උරා බීමට දනී. මේවා පුහුණු කළ කෙණෙකු නැත. මෙවැනි දේ නෛසර්ගිකය. මේවා අධ්‍යාපනය යන ශීර්ෂය යටතේ නොව ද්‍රව්‍ය ධර්ම ශාස්ත්‍රය, ප්‍රාණ විද්‍යාව හා සත්ව විද්‍යාව යන මාතෘකා යටතේ විස්තර වන ඒවාය. යත්නසිද්ධ කොටස හෙවත් ඉහත සඳහන් නෛසර්ගික දැනුම පියුණු කරගැනීම සඳහා යොදාගන්නා ක්‍රම, අධ්‍යාපනය වශයෙන් සලකමු.

එම අධ්‍යාපනය දියුණු වන්නේ සමාජයක් දියුණු වන තරමටය. සමාජයක් දියුණු වන්නේ අධ්‍යාපනය දියුණුවන තරමටය. මෙසේ එකින් එක පෝෂණය ලබන, ජාතියක් හා අධ්‍යාපනයක් සෑම විටම යොමුවන්නේ රටෙහි ස්වාභාවික පිහිටීම දෙසටය. ජනතාව ජීවත් වන්නේ රටෙහි පිහිටීමට සුදුසු ලෙසකටය. ඔවුන් ලබන අධ්‍යාපනය ද ඒවාට සම්බන්ධ වේ. යම් රටක යම් කාලයක සමාජය දියුණු තත්වයක පවතීනම් එකල එම රටේ අධ්‍යාපනය ද දියුණු තත්වයක පැවැතියයුතුමය. එම අධ්‍යාපනයද රටට ගැලපෙන එකක් විය යුතුය. අධ්‍යාපනය රටට නොගැලපෙන්නක් හෝ නොදියුණු එකක් වූ සමයක ජාතිය ද පිරිහී පවතිනු නියතය.

අපගේ මෙම පර්යේෂණයට ඉලක්ක වූ අටුවා යුගයේ ලාංකික සමාජය සෑහෙන ප්‍රමාණයකින් දියුණුව පැවැතින. තත්කාලීන කෘතිවලින් බැසගතයුතු නිගමනය නම් එදා සමාජය එකල ලෝකයේ කවර රටකට වුවද දෙවෙනි නොවූබවය. රුවන්වැලි, අභයගිරි, ජේතවන වැනි දා ගැබ් ද, මින්නේරිය, කලා වැව, කාච්චාදූව වැව, නුවර වැව වැනි විශාල වැව් ද, යෝධ ඇල, මීනිපේ ඇල, ඇළහැර ඇල වැනි ඇලවල් ද සීගිරි මාලිගාව වැනි ගොඩනැගිලි ද සීගිරි සිතුවම් වැනි කලා කෘති ද යම් සමාජයක නෂ්ටාවශේෂ වශයෙන් පවතීනම් එම සමාජයේ දියුණුව අනුමාන කිරීම අපහසු නොවේ. එදා තුබූ යාන්ත්‍රික පහසුකම් ඇසුරෙන් එවැනි නිර්මාණයන්

කිරීමට දැනුමක් ඔවුන්ට ලබාදුන් අධ්‍යාපනය පුළු එකක් විය නොහැක. අප මෙහි කරුණු සොයා බැලීමට උත්සාහ කරන්නේ එම අධ්‍යාපනය පිළිබඳවය.

එදා ලාංකිකයන් ලත් දැනුමෙන් කුඩා දෙය සෑහෙන ප්‍රමාණයකින් ඉතිරිව ද තිබේ. ඉතිරිව ඇති දෙයින් සෑහෙන ප්‍රමාණයක් පර්යේෂකයන් විසින් සොයාගෙන ද තිබේ. හඳුනාගෙන ද තිබේ. ඒවා දෙස බලනවිට තවත් හඳුනාගත නොහැකිවූ හා සොයාගත නොහැකිවූ ද නටබුන් වී ගියාවූද විශාල ප්‍රමාණයක් ඇති බවත් පැහැදිලි වේ. මෙයින් එදා ලාංකිකයා ලබා තුබූ දැනුම වඩා සාර්ථකලෙස අනුමාන කළහැකිව තිබේ. එම දැනුම ලබාගත් මාර්ග තත්කාලීන අධ්‍යාපනය වේ. එය ලබාගත් සැටි තත්කාලීන සාහිත්‍ය කෘතිවල අල්ප වශයෙන් වුවද ඇතුළත්ව තිබේ. මෙහිලා ප්‍රධාන මූලාශ්‍රය ලෙස සැලකිය යුත්තේ ලංකාවේ ලියැවුන පාලි අට්ඨකථා හා වංසකථායැ.

ථෙරිය නිකායයේ ත්‍රිපිටකය විස්තර කිරීම සඳහා පිළියෙල වූ අට්ඨකථා ලංකාවේ ඉතිහාස පොත් නොවේ. එහෙත් භාරතයේ ඉතිහාස මූලාශ්‍රයන් හැටියට "පුරාණ ග්‍රන්ථ" උපයෝගී වන ප්‍රමාණයට වඩා ප්‍රමාණයක් අට්ඨකථා ලංකා ඉතිහාසය සොයාගැනීමට උපකාර වේ. බැමිණිතියාසාය නම් සාගතය ලංකා ඉතිහාසය වෙනස් කිරීමට පුළුවන් වූ සිදුවීමකි. එහෙත් එය පිළිබඳ විස්තරය සොයාගත හැකි වූයේ "සම්මෝහ විනෝදනී" අට්ඨකථාවෙනි. මෙසේ ලංකා ඉතිහාසයට සම්බන්ධ වන කරුණු රැසක් සොයාගැනීමට මේ අට්ඨකථා උපකාරී විය. අට්ඨකථා අතුරෙන්ද අධ්‍යාපනය පිළිබඳව සෙවීමේදී වැඩිම ප්‍රමාණයක් සම්මෝහ විනෝදනී හා විනයට්ඨකථාව වැදගත් වන බව පැහැදිලි විය. එහෙත් මේ කාරණයෙහිදී සියලුම අට්ඨකථා සැලකියයුතු ප්‍රමාණයකින් සහාය වේ. දීපවංශය හා මහාවංශය එදා සමාජයේ තොරතුරු සඳහන් කිරීමම ප්‍රධානකොට විරචිත ඒවාය. ඉහත සඳහන් පොත්වලට එකතු කිරීමට එකල ලියැවුන කථාපොත් හා විසුද්ධිමග්ග වැනි පොත් ද වැදගත් වේ. මේවාට අතිරේකව එකල ලංකාවේ ලියැවුන ශිලා ලේඛන ද කරුණු සමර්ථනය කිරීමට ඉතා වැදගත්ව පවතී.

සමාජයක පැවැත්ගෙන එන දෙයක් අනුමාන කිරීමෙහිදී එයින් පසුකාලයකට අයත් දේද බොහෝ සෙයින් උපකාරී වේ. ඉතිහාසඥයන් නොයෙක් විට මේ උපකාරය ප්‍රයෝජනයට ගෙන තිබේ. මේ අනුව නවවන හා දසවන සියවස් වල සුලභව හමුවන සෙල්ලිපි හා එයට මඳක් පෙර කාලයට අයත් සීගිරි පද්‍ය ද ඇතැම් කරුණු සනාථ කිරීමට උපයෝගී කරගත්තෙමු.

එදා ලංකාවේ අධ්‍යාපනය විස්තර කිරීම සඳහා ලියැවුන කිසිදු රචනාවක් ඉහත සඳහන් සාහිත්‍ය කෘති අතර නැත. අටුවා යුගයේ අධ්‍යාපනය ගැන කරුණු ඉදිරිපත් කිරීමේදී එකල ලංකා සමාජය ලබා තුබූ දියුණුව එම සමාජයේ නෂ්ටාවශේෂ වලින් හා එදාට අයත් කතා පුවත් වලින් අනුමාන කොට, එම දියුණුව විවිධ කර්මාන්ත වශයෙන් කොටස් කිරීමත්, එක් එක් කර්මාන්තය ලබා තිබුනැයි අනුමාන කළහැකි උපරිම ප්‍රමාණය සොයාගෙන ඒ තත්වයේ දියුණුව ඇති කිරීමට සාමාජිකයන් ලබා තුබූ දැනුම හා එම දැනුම ලබාගැනීමට උපකාර වූ මාර්ග හැකිතාක් සොයා දැක්වීමත් සුදුසු මග යයි සැලකිමු.

මෙහි දී පැවිදි පක්ෂය හා ගිහි පක්ෂය ලැබූ අධ්‍යාපනය වෙන්කොට දැක්වීම සුදුසු යයි සැලකිමු. පදනම හා ආවශ්‍යකතාව අතින් ඇති විවිධත්වය සැලකීමෙනි. පැවිදි පක්ෂයේ අධ්‍යාපනය එකක්ම වූ බැවින් එය මුලින්ම විස්තර කිරීම සඳහා තෝරා ගතිමු. ගිහි සමාජය මුළු රටේම සාමාජික බර දරා සිටින හෙයින් එම සමාජයේ වැඩ කොටස් බොහෝ වර්ගවලට බෙදා දැක්විය යුතුය. එහිදී සාමාජිකයන් පවුල් වශයෙන් පරම්පරාවෙන් පවත්වාගෙන ආ ශිල්ප හැකිතාක් තොරතුරු සහිතව ඉදිරිපත් කිරීමට උත්සාහ දරා ඇත. සමාජයේ හැම දෙනම කළ හැම වැඩ කොටස්ම විස්තර කිරීම හෝ ඒවාට අවශ්‍ය තොරතුරු ලබාගැනීම කළ නොහැක්කකි. එනිසා එදා සමාජයේ උන්නතියට ප්‍රධාන වශයෙන් සහාය වූ හා පැහැදිලිව පෙනෙන වැඩ කටයුතු පමණක් මෙහි විස්තර කිරීම සඳහා තෝරාගතිමු.

ලාංකික සමාජයේ ඒ ඒ කොටස්වල රැකියාව වශයෙන් තුබූ දේ වෙනම ශිල්ප වශයෙන් සඳහන් කරන ලදි. පොදු දෙයක් වශයෙන් තුබූ අකුරු උගැන්වීම වෙනම ද වෙජ්ජ-සත්ථ යන මාතෘකාව යටතේ ඖෂධවලින් හා මන්ත්‍ර වැනි දෙයින් ජනයාගේ සෞඛ්‍යය රැකීමට යොදාගෙන තුබූ ක්‍රම ද කෘෂිකර්මය යන මාතෘකාව යටතේ ගොවිතැන, වැව් හා වාරිමාර්ග, ගලපාලනය යන මේවා ද, ගණිත යන මාතෘකාව යටතේ ගණන්ක්‍රම භාවිතය ද, මුහුර්තික යන මාතෘකාව යටතේ ජ්‍යොතිෂ කටයුතු ද, යුධකටයුතු යන මාතෘකාව යටතේ එකල පැවැති යුධ සේවය ද, මසුන් මැරීම හා දඩයම යන මාතෘකාව යටතේ එකල ධීවර කර්මාන්තය හා වනයේ මස් ලබාගැනීම කළහැටි ද, ලේඛ යන මාතෘකාව යටතේ ඇඳුන් සකස් කිරීම ද, ස්තූප නිර්මාණය වෙනම ද, වෙළඳාම යන මාතෘකාව යටතේ වෙළඳ කටයුතු හා බැංකු ක්‍රම ද, සියුම් කලා යන මාතෘකාව යටතේ මූර්ති, චිත්‍ර හා නැටයම් ශිල්පද, ලලිතකලා යන මාතෘකාව

යටතේ විනෝදය ද, වඩාකී කම යන මාතෘකාව යටතේ ගෙවල් සෑදිම නැව් හා රථ සෑදිම යන මේවා ද, යාන වාහන යන මාතෘකාව යටතේ ඇතුන් අසුන් හික්මවීම, රිය පැදවීම, නැව් පුවවීම යන මේවාද, කුම්භකාර යන මාතෘකාව යටතේ මැටි බඳුන් සෑදීමද, කම්මාර යන මාතෘකාව යටතේ ලෝහ හා ලෝහ භාණ්ඩ නිපදවීම ද, පේසකාර යන මාතෘකාව යටතේ රෙදි වීවීම ද, රජක යන මාතෘකාව යටතේ එම කුලයේ රකියාව ද, මෙහි විස්තර කිරීමට තෝරාගෙණ ඇත.

රජකුමරුවන් ලැබූ අධ්‍යාපනය මේවායින් ඈත් වුවත් නොවූවද, මේවාට විශෙෂ එකකි. එබැවින් එහි වෙනස්කම් වෙන මාතෘකාවක් යටතේ විස්තර කිරීමට තෝරාගෙණ ඇත. කාන්තාවෝ මේ සඳහන් කළ කොටස්වලට ම අයත්වූහ. එහෙත් ඔවුන් ලැබුවේ වෙනම අධ්‍යාපනයකි. එහෙයින් එයද වෙනම විස්තර කෙළෙමු. මේ දැනුම ලබාගත් හැටි හා ඒවා ලබාගත් තැන් සොයාගත හැකිතාක් විස්තර සහිතව ඉදිරිපත් කරඇත. මේ අතර ලංකාවේ ගුරුවරයා හා ශිෂ්‍යයා පිළිබඳව පවත්නා විශ්වාස හා චත්-පිරිත් ද සඳහන් කර ඇත. එකල පොත් පත් සාදාගත් සැටි හා ඒවායේ තත්වයද ඉහත සඳහන් ශිල්ප ඉගෙනීමට අතිරේකව සෑම දෙනාගේම බුද්ධි වර්ධනය කරගත් සැටි ද වෙනම දක්වා මෙයින් බැසීමට බලාපොරොත්තු වූ නිගමනය ඉදිරිපත් කර ඇත. එනම්, ක්‍රිස්තු වර්ෂ සයවන සියවස දක්වා යමාජය රටට ගැලපෙන දියුණු තත්වයේ අධ්‍යාපනයක් ලබා සිටි බවය.

මේ සඳහා කරුණු සෙවීමේදී ලංකාවේ ඉතිහාසය පිළිබඳව මෙතෙක් කල් පයෝෂණ කළ වියතුන්ට පින්දීම කළ යුතුම විය. මහාචාර්ය සෙනරත් පරණවිතාන පඬිතුමන්ගේ පයෝෂණ මෙහිදී වෙන හැමෙකකට ම වඩා අපට සහාය වූ බව සඳහන් කළ යුතුව ඇත. ලංකාවේ එකල අධ්‍යාපනය පිළිබඳව තොරතුරු ලබාගැනීමට උපකාර වන, ලංකාවේ ශාසන හා සමාජ ඉතිහාසය පුරාවස්තු හා පාලි පොත් ගැන මෙතෙක් වියතුන් පැවැත්වූ පයෝෂණයන් සිංහල, ඉංග්‍රීසි, හින්දි යන භාෂාවලින් පළවී තිබෙන බොහොමයක් හා මුළු පාලි සාහිත්‍යය-මත් කියවා බැලීම මෙහිලා අපගේ සුදුසුකම ලෙස සඳහන් කළහැක. සොයාගන්නා තොරතුරු ඇසුරෙන් බැසගන්නා නිගමන විචාරකයන් අතර ප්‍රතිවිරුද්ධව ද පවති. එකම පුරාවස්තුවකින් සිප දෙනෙකු නිගමන කීපයකට බැසගනු පෙණේ. ඉතිහාස කරුණු පිළිබඳව ඇති මතභේද

ඒවාය. අධ්‍යාපනය පිළිබඳව කරුණු සෙවීමෙන් අප බැසගත් ඇතැම් නිගමන බොහෝ විචාරකයන් අනුමත කළ ඒවාය. එහෙත් එසේ නොයැයදෙන ඒවා මෙන්ම තවත් සාධක ලැබෙනතුරු බලාපොරොත්තු විය යුතු ඒවා ද නැත්තේ නොවේ. ලංකාවේ නැව් කර්මාන්තය පිළිබඳව මෙහි දැක්වෙන අදහස ද එවැන්නකි. විශාල ප්‍රමාණයේ හා විශාල සංඛ්‍යාවක ජල-යාත්‍රා භාවිත කිරීමේ ආවශ්‍යකතාවත් එසේ භාවිතකළ අවස්ථාත් එවැනි යාත්‍රා විදේශවලින් ලබාගත් බවට සාධක නැතිබවත් ඉදිරිපත් කිරීමෙන් ලංකාවේ විශාල ජලයාත්‍රා තැනූ බව සනාථ කිරීමට උත්සාහ දැරීමු.

එදා ලංකාවේ ලෙබ (ප්ලෑන්) සම්පාදනය ක්‍රියාවත් හා ශිල්පයක් වශයෙන් පැවැති බව සනාථ කිරීමට අප මෙහිදී ගත් උත්සාහය ද විචාරකයන්ගේ විමර්ශනවල ස්පර්ශය ලැබිය යුතුව ඇත. මෙහි ඇති ඒවායින් යම් නිගමනයක් මෙතෙක් සමාජය පිළිගෙණ තිබේනම් මේ පර්යේෂණය එම නිගමනයන්ට රුකුළක් වේවා. යම් නිගමනයක් මෙතෙක් සමාජය පිළිගෙණ නැතිනම් ඒ පිළිබඳ ව සිතා බැලීමට මෙය උනන්දු කරවීමක් වේවා.

## අටුවා යුගයේ හෙළදිව අධ්‍යාපනය

### 1 වන පරිච්ඡේදය.

### 1 අටුවා යුගය

1// අටුවා, අට්ඨකථා යන නම්වලින් හැඳින්වෙන සාහිත්‍යය මුළු ලෝකයේම එයට පමණක් විශේෂිත ලක්ෂණවලින් යුක්ත වූවකි. භාරතයේ දක්නා භාෂ්‍ය ග්‍රන්ථ කිසියම් ප්‍රමාණයකින් අට්ඨකථාවලට සමාන වුවද අට්ඨකථා එය ඉක්මවා පැවැති ලක්ෂණ ද දරයි[1]. බුදුරදුන් දෙසූ දහම් කොටස්, දෙසීමට හේතුවූ කරුණු, එම දේශනාවන්ට උපයෝගී වූ කරුණු, එම දේශනාවලින් ඇතිවූ ප්‍රතිඵල යන මේවා විස්තරතර දැක්වීම අට්ඨකථාවල පොදුවේ දක්නා දෙයකි. බුදුරදුන් දෙසූ ධර්මයක් හෝ පැණවූ නීතියක් හෝ නොයෙක් දෙනා නොයෙක් ලෙසට විස්තර කිරීමට ඉඩ නොතබා සියල්ලන් එකලෙසින්ම විස්තර කරන ලෙස සලස්වා තිබීම මෙහි විශේෂ ප්‍රයෝජනයයි. බුද්ධ දේශනාව මූලය ලෙස තබා ඒවායේ අරුත් විස්තර කිරීමේ ස්වරූපයෙන් සියල්ලම නිර්විකාරීටවත් කිරීම අටුවා කතුවරුන්ගේ අධ්‍යාශය වියහැක. එහෙත් අට්ඨකථා සැකෙන පමණට දියුණු තත්වයට එන්ට පෙර ඉහත සඳහන් දෙය, එනම් ධර්මය විවිධලෙස තේරන්ට පටන් ගැනීම කිසියම් ප්‍රමාණයකට සිදුවිය. බුද්ධ ධර්මය බුදුරදුන් ජීවමාන කාලයේමත් නොයෙක් භික්ෂූන් වෙනස්කම් සහිතව තේරුම්ගත්බව මුල් දෙසුම්වලින් ම පැහැදිලිවේ. බුද්ධකාලයේම අරිට්ඨ නම් භික්ෂුවක් " මා දැනගෙන සිටින ලෙසට නම් බුද්ධ ධර්මය අනුව භික්ෂූන්ට ස්ත්‍රී සේවනය සුදුසුය. එයින් නිවන් ලැබීමට හානියක් නැත" යනුවෙන් ප්‍රකාශ කරන්ට විය. වෙනත් භික්ෂූහු මෙය බුදුරදුන්ට දැන්වූහ. බුදුරදුන් අරිට්ඨ භික්ෂුව කැඳවා විචාළවිට ද එම භික්ෂුව තමාගේ වැටහීම එසේම ප්‍රකාශ කර ඇත. බුදුරදුන් වහන්සේ එම භික්ෂුවගේ අදහස ප්‍රතික්ෂේප කරමින් ධර්මදේශනාවක් කළහ[2]. බුදුරදුන් පිරිනිවන් පෑද්දී අනඳ හිමියන්ට වදාළ "මා නැතිවූ කල සංඝයා කැමතිනම් ඛුද්දානුඛුද්දක ශික්ෂාපදයන් අත්හැර දමන්නැ" යි යන දෙසුමෙහි ඛුද්දානුඛුද්දක ශික්ෂා පදයන් විවිධලෙස තේරන්ට වීම නිසා බුද්ධපරිනිර්වාණයෙන් සමීප කාලයේ පටන් මතභේදයක් ආරම්භ විය. අවුවශයෙන් බුද්ධ පරිනිර්වාණයෙන් පළමුවන සියවස ඉක්මෙන්ම මේ මතභේදය නිකාය භේදයක් බවට පැමිණිබව චුල්ලවග්ගපාලි සත්තසතිකක්ඛන්ධයෙන් පැහැදිලි වෙයි.

---

1. භාසාඉ. 500 - 501

මෙසේ බොහෝ දේශනාවලට, වෙනස්ලෙස අරුත් පැවසීම නිසා නිකායභේදය ද වැඩි විය.

2// නිකාය භේදය බලවත් වනවිට එම නිකාය සෙසු නිකායයන්ගෙන් වෙන් වී පෙනෙන විශේෂ කරුණු කෙරෙහි වඩා සැලකිල්ලක් දක්වමින් අර්ථකථා සැපයීමට ඒ ඒ නිකායය-න් උනන්දු වූ බව පෙනේ. මෙයින් සාහිත්‍යයේ පෝෂණය වූ අතර බුද්ධ ධර්මයේ එක් එක් නිකාය-යන්හි අර්ථනිරූපන වඩා පළල්ලෙස ප්‍රකාශ කළයුතු විය. මේ සඳහා රචිත වූ ග්‍රන්ථ අතර මොග්ගලිපුත්ත තිස්ස තෙරුන්ගේ කථාවත්ථුප්පකරණය වැදගත් එකකි. මේවායේ නැතක් තැන්වල වෙනත් නිකායයන් පිළිගන්නා අර්ථ නිරූපනයන් ඛණ්ඩනය කිරීමට උත්සාහ දරා තිබේ[3]. මේ වර්ගයේ ග්‍රන්ථ කොපමණ රචිතද යනුත් ඒවායේ කෙබඳු අදහස් ගැබ් වීද යනුත් තීරණය කිරීමට සාධක සොයා ගත නොහැක. ඇතැම් කෘති ටිබැට් හා චීන අනුවාදවල ඇසුරෙන් අනුමාන කළ හැකිව ඇතත්, ඇතැම් ඒවායේ සොයාගත හැකිව ඇත්තේ නම් පමණි. මෙසේ නම් පමණක්වත් සොයාගත නොහැකි කෘති ද බොහෝ තිබෙන්ට ඇත. තුන්වන සංගායනාව දක්වා ඇතිවූ නිකාය අටළොසක් ගැන සඳහන් වේ[4]. මේ එක් එක් නිකායවල පිළියෙල වූ අඨකථා බොහෝ ගණනක් වීමට ද ඉඩ තිබේ. සර්වාස්තිවාදය ථෙර වාදයෙන්ම බිඳුනකි[5], එය කථාවත්ථුප්‍රකරණය රචනා කිරීමට පෙර වෙන්වූ බව, කථාවත්ථුප්‍රකරණයේ සර්වාස්තිවාදය ඛණ්ඩනය කිරීමට උත්සාහ දරා තිබීමෙන් පැහැදිලි වේ[6]. සර්වාස්තිවාදීහුද අභිධර්ම පිටකය බුදුරදුන් දෙසූ බව නොපිළිගනිති. "සර්වෙ අභිධර්මා සූත්‍රාර්ථකථා නමි" (මුළු අභිධර්මය ම සූත්‍රයන්ගේ අර්ථ විවරණයකි) යනු අභිධර්ම කෝෂ ටීකාව ලියූ යශෝමිත්‍ර හිමියන්ගේ ප්‍රකාශයකි[7]. සර්වාස්තිවාදීන්ගේ ද අභිධර්ම පිටකයක් විය. එහි ග්‍රන්ථ ඒවායේ ..............

---

2. මනි. විභ්‍රමු. අලගද්දූපම සුත්ත
3. කප. පි. 327 - 328
4. දීව. iV 90 ගා.
5. දීව. iV 87 ගා.
6. කප. පි. 74 - 90
7. අකෝට. 41

කර්තෘවරුන්ගේ ම නමින් තබා ඇත. මේවා ද සතක් විය. ඥාන ප්‍රස්ථාන, ප්‍රකරණපාද, විඥාන කාය, ධර්මස්කන්ධ, ප්‍රඥප්තිශාස්ත්‍ර, ධාතු කාය, සංගීති පර්යාය යන එම සත පිළිවෙලින් ආර්ය කාත්‍යායන, ස්ථවිර වසුමිත්‍ර, ස්ථවිර දේව ශර්ම, ආර්ය ශාරිපුත්‍ර, ආර්ය මෞද්ගල්‍යායන, පූර්ණ (හෝ වසුමිත්‍ර), මහා කෞෂ්ඨිල (හෝ ශාරිපුත්‍ර) යන කර්තෘවරුන්ගේ රචනා ලෙස ඔව්හු පිළිගනිති[8]. මේ පොත් හා මේවා මෙන්ම නාමශේෂ භාවයට ගොස් ඇති විභාෂා නම්වූ අර්ථකථාව ද ඉහත සඳහන් අර්ථකථාවන්ට ඇතුළත් කළහැක.

3// විවිධ නිකායයන් බුද්ධ ධර්මය විස්තර කරමින් සැපයූ අර්ථකථා අතුරෙන් පැරණිකමත් සහිතව ම අප අතට පැමිණ ඇත්තේ ලංකාවට ගෙණ ඒවාය. ත්‍රිපිටක ග්‍රන්ථයන් සමඟ මේවා ද සංගායනාවලදී සංගායනා කරනුලැබූ බව ද සඳහන් වේ[9]. විභජ්ජවාදි මණ්ඩලය අනුමත කළ එම අර්ථකථා එම කොටසට අයත් හැම පිරිසක් විසින්ම පොදුවේ පිළිගන්ට ඇති බව සිතිය හැක. මේ කොටස්වල බුද්ධ ධර්මය තේරුම්කර ඇත්තේ මේ අර්ථ-කථාවන්ට අනුවය. එහෙත් එම අර්ථකථාවන්ට අයුනොවූ සමහර තැන් වෙනස්ව තේරන්ට ඇත. ඒවා මුල්කොටගෙණ පිරිස් වෙන්වන්ට ද ඇත. එහෙත් ඒ හැම නිකායයක් ම විභජ්ජ-වාදී මණ්ඩලය අනුමත කළ, එම අර්ථකථා අනුමතකර ඇත. ලංකාවේදී මුල් කාලයේ සිංහල භාෂාවෙන් තුබූ ඒවා ද පසුව පාලියට පෙරලන ලදී. මේ අතර සැලකියයුතු ප්‍රමාණයකින් පරිවර්ධිත වූ බව ද පෙණේ. මේ අර්ථකථාවල ඇතැම් විට දේශනා පෙළෙහි ඇති දේ වෙනස් කර ද දක්නාලැබේ[10]. මේ වෙනස්කම් අතර අර්ථකථා පිළියෙල වන අවස්ථාවේදී භික්ෂු සමාජය වෙනස්වී ගොස් සිටි ප්‍රමාණය ද සාමාජික පරිසරය ද, අනුව සිදුවූ දේ වැඩිවශයෙන් දක්නාලැබේ. උදාහරණයක් වශයෙන් භික්ෂූන් වහන්සේගේ ප්‍රතිපත්තිය විස්තර කරනතැන සාමඤ්ඤඵල, බ්‍රහ්මජාල සූත්‍රවල දක්නා පරිදි භික්ෂුව වෙදකම් කිරීමෙන් වෙන්වූ කෙනෙකි. එහෙත් විනය අටුවාව සපයන කාලය වන විට භික්ෂූන් වහන්සේලාගෙන් වැඩිදෙනා දායකයනට වෙදකම් කියාදීමෙන් උපකාර කිරීමට පුරුදුව සිටියහ. පුරෝගාමී මහා තෙරවරු දක්ෂලෙස වෛද්‍ය උපදෙස් දීමෙහි සමත් අයවූහ[11]. මේ තත්වය උඩ භික්ෂුවට වෙදකම්

---

8. අකෝ. භූමිකා. 12
9. මපු. ඡේදු. 1
Enbc. 35
10.
11. සපා. ඡේදු. 337

කිරීමට විනය අටුවාවේදී ගෝත්‍රයක් සාදා දී තිබේ[12]. එම ඥාතිගෝත්‍රයට ඇතුළත් නැති කෙනෙකුට වුවත්, එවැනි උපකාරයක් කිරීමට ද හැකි විදියක් එහි සඳහන් කර තිබේ[13]. මෙවැනි උදාහරණ කිසියම් ප්‍රමාණයක් අර්ථකථාවෙන් සොයාගතහැක. මේවා එම අර්ථකථාවන් වැඩිදියුණු කිරීමේදී සිදුවූ ඒවා ලෙස සිතියහැක.

4// තථාගත දේශනාවන් විස්තර කිරීමට හා ඒවායේ අර්ථ නිරූපනයට ඇති කරනුලැබූ අර්ථකථා කොටස් සතරකට වෙන්කළ හැක.

(අ) පාලි ත්‍රිපිටකයට අයත්ව ඇති අර්ථකථා

(ආ) බුද්ධ පරිනිර්වාණයෙන් පසු තුන්වන ධර්මසංගායනාව දක්වා දඹදිව ඇතිවූ අර්ථකථා

(ඉ) මිහිඳු හිමියන්ගේ හෙළ අටුවා

(ඊ) බුද්ධඝෝෂ හිමියන් ප්‍රධාන පිරිස ලියූ පාලි අර්ථකථා

යනු විසිනි. විනය පිටකයේ භික්ඛු විභංග, භික්ඛුනී විභංග යන දෙක ද නිද්දේසපාලිය ද විනයපිටකයේ පරිවාර පාලිය ද ත්‍රිපිටකයට අයත්කොට ඇති නමුත්, ඒවායේ බුද්ධ ධර්මය විස්තර කිරීම ප්‍රධාන කාර්යයව තිබේ[14]. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව පිළියෙල වුවද කථාවත්ථුප්පකරණය ද ත්‍රිපිටකයට ඇතුළත්කොට සලකන බැවින් මේ කොටසට ගණන් ගතහැක.

---

12. සපා. ශේමු. 335 - 336
13. සපා. ශේමු. 337
14. "මේ පසුව නම්කළ කෘතිය (විභංගය) ශික්ෂාපද 227 කින් යුත් පාතිමොක්ඛයේ පැරණි අර්ථ කථාවක්මය. මේ අර්ථකථාව ත්‍රිපිටකයට ඇතුළත්වීමේ සම්මානය ලබා තිබේ. සුත්ත විභංග යන්නෙන් අදහස් කරන්නේ සුත්තයන්ගේ විස්තරයයි. මේ කාරණයෙහිදී අප සුත්ත වශයෙන් ගතයුත්තේ පාතිමොක්ඛයේ එන වෙනවෙනම ඡේදයෑ. ඒ හැම සුත්තයන්ම වචනයට වචනය යොදා විස්තර කර තිබේ". ( H.I.L.) 24.

"විනය පිටකයට පරිවාර පාලිය වේදයට අනුක්‍රමණිකා හා පරිශිෂ්ට මෙනි" ( H.I.L. 33) "මෙලෙයින් සම්පූර්ණ නිද්දේසපාලිය සුත්තනිපාතයේ ඒ ඒ කොටස්වල අර්ථකථාවකි" (පාසා.217)

බුද්ධ පරිනිර්වාණයෙන් පසු තුන්වන සංගායනාව දක්වා බුද්ධ දේශනාවලට වෙන වෙන නිකායවල අර්ථ දීමට පුරුදු වීම නිසා බොහෝ අර්ථකථා ඇතිවන්ට ඇත. මේවා තත් කාලීන භාරතීය භාෂාවලින් ලියැවෙන්ට ඇත. පසු කාලයක සර්වාස්තිවාදී අභිධර්ම ප්‍රකරණ සතට හා විභාෂා වැනි අර්ථකථාවලට ද මුල්වන්ට ඇත්තේ එම අර්ථකථාය. මිහිඳු හිමියන් ඇතිකළ හෙළටුවා නාමයෙන් බවට පත්වී ඇත. සැකසහිතව සොයාගත හැකි වචන කීපයක් හැර ඒවායේ කිසිත් මුල් තත්වයෙන් නොලැබේ. භාරතීය අර්ථකථා මේවාට මූලාශ්‍රය වූබව නිසැකය[15].

5// මිහිඳු හිමියන් තැබූ අර්ථකථා ලංකාවේ දී වැඩි දියුණු වූ බවට සැකයක් නැත. බුද්ධඝෝෂ හිමියන් ඇතුළු පිරිසගෙන් පිළියෙල වූ සතරවන කොටසේ අත්ථකථාවල ඇතුළත් වී තිබෙන කරුණු ම ඊට සාධක වේ. මනෝරථපූරණියෙහි ඇතුළත් ලංකාවේ සිදුවීම් වලින් අඩකටත් වඩා රුහුණේ සිදුවීම් බවත්, ඒ නිසා එහි පැරණි සිංහල පිටපත රුහුණේ සකස් වූ බව සිතියහැකි බවත් ආචාර්ය අදිකාරම් මහතා කියයි[16]. බුද්ධඝෝෂ හිමියන් පැමිණෙන විට ලංකාවේ සකස් වී පැවැති අඨකථා බුද්ධඝෝෂ හිමියන් ඇතුළු පිරිස ලියූ පාලි අටුවාවලට මුල වී තිබේ. පාලි අඨකථාවල මූලාශ්‍රය හැටියට කරුණු 28 ක් ආචාර්ය අදිකාරම් මහතා ඉදිරිපත් කරයි[17]. ඉන් 14 ක් ම එකල ලංකාවේ තුබූ පොත් ලෙස හැඳිනගත හැකි ඒවාය. ඉන් අන්ධට්ඨකථා, පොරාණට්ඨකථා යන දෙක ලංකාවේ පොෂණය නොලැබූ ඒවා ලෙස සිතිය හැකිය. පොත් වශයෙන් සැලකිය නොහැකි 14 න් "පාරසමුද්දවාසී ථෙරා, පොරාණා, පොරාණකාචරියා" යන තුන ද භාරතීය බවත් සිතිය හැකිය. මෙයින් ම බැසගත හැකි නිගමනය සතරවන වර්ෂයට අයත්තෙට දැක්වූ පාලි අඨකථා විශාල ප්‍රමාණයකින් ලංකාවේ තොරතුරුවලින් පොෂිතව තිබේය යන්නයි.

6// ලංකාවේ අධ්‍යාපනය ගැන තොරතුරු ලබා ගැනීමට උපකාර වන්නේ වැඩි වශයෙන් ම ලංකා සමාජය ඇසුරෙන් නිපන් සාහිත්‍ය කෘතිමය. එසෙයින් ඉතා වැදගත් අඨකථා වර්ග සතරෙන් මෙහි ආශ්‍රය ලෙස තෝරා ගනු ලබන්නේ සිවුවන වර්ගය වූ ලංකාවේ පාලි අඨකථාය. එහෙත් ඒවායේ ඇතුළත් කරුණුවලින් සමහර ඒවා ලංකාවට සම්බන්ධ ද නැද්දැයි

---

15. මපු. ශේමු. 1
16. Ehbc. 6
17. Ehbc. 10